

## VALENTINE GIFT

For forty years
We shared together
Hand in hand
Good times & happy times
Rejoicing in elation
We embraced each other
In bad times & sad times
Comforting & supporting
Giving strength to each other
In sickness & in health
For better or for worse
We've pulled the carriage
Of marriage together
What a great partnership
Of love & commitment
Sweet memories of the past
Surfacing
Flooding our minds
We don't need roses or gifts or cards
Just the love in our eyes
Blending together
Is sufficient for us
On this Valentine's Day

**Lucky Gunaratna**



## පහන් වැල

සංස්කරණය
කුමාරි ප්‍රියංගිකා

මුලින් ඔබ දුටුව දින බැඳුන පෙම හ දේ
කෙමෙන් එය දැඩිව අලි කළු ගලක් ලෙ දේ
මෙදැන් ඔබගේ බස මොන පුදුමය ද ව දේ
නිවන් දකින තුරු මා හැර වෙන කවුද හො දේ

-ගජමන් නෝනා-




## බලංගොඩ මුත්තා



තිස් එක් දහස් වසකට පෙර මෙලක් දිව
මැණික්පු බලංගොඩ පෙදෙසෙහි විසුව
මානව වංශයක වත ගොත හෙළි කෙරුව
දැරණියගල නමට පළමුව බැති පිදුව

චීන රටේ පීකිං මානවයාද
ජාවා දූපතේ ආදී වැසියාද
දක්ෂිණ අප්‍රිකා සෝලෝ මිනිසාද
සමකාලීනයන් වේ අපගේ මුත්තාද

ඇකියන්කුඹුර මුල්ලේගම මස්කෙළිය
ගංගොඩදෙණිය බෙලිලෙන නාවලපිටිය
යක්ගිරිලෙන ද මුලතිව් ඔක්කම්පිටිය
හැම දෙස්ගුණ කළාපෙම ඔහු හට රිසිය

දොරවක්කන්ද කුරුවිට හා කිතුල්ගල
විසු බව පෙනී යයි ලෙන් හා ගුහාවල
හෝර්ටන් තැන්න හා කඳුකර තංගමල
දඩයම් පිණිස විසුවයි එළි පහළිවල

බෙල්ලන් බැඳි පැලැස්සේ වං හුං අනුව
ගණකම හිස් කබල හා කෙටි ගෙල ඇතිව
මුක්කම් නාසිකාවක් ලොකු දත් පෙළද
දික් වූ අත් ද තිබුණත් බුද්ධියෙන් මඳ

ගව හුරු වඳුරු ගොළුබෙලි මින් මස්දගෙන
පළතුරු මී පැණි ද අල අතරට යෙදුන
අමුවෙන් නොව යොදා ගිනි බල පළහ ගෙන
තම්බනු පිණිස වළං ද පසු කළෙක ගෙන

විලාසිතා බටහිර සිට එතැයි සිතන්
මුවත් අයා අප ඒ දෙස සිටිමු බලන්
එමුත් එදා සිටිවුන් පබලුද බෙල්ලන්
රතු කහ නිල් ලේප ගන්වා සිටියෙ බැඳන්

කිතුල්ගල කැණීමෙන් ගොඩනැගිල්ලක
සක්ක ගලින් බැඳි පාදම හමුව ඇත
ඉදිකෙරුමේ කලා පිළිබඳ දැනුමක්ද
තිබු බව ඔහුට පෙන්වයි බටදොඹ ලෙන ද

ස්වයංක්‍රීය අවි අද පිටරටින් ගෙනැත්
තිබුණද වසර තිස් හය දහසකට පෙරත්
දක්ෂිණ ආසියාවෙම පැරණිම ඉමහත්
අවි විය පාහියන්ගල මුත්තාගෙ ළඟත්

කහඳ තිරිවානා ඇටකටු අඟින් කළ
රවුම් ත්‍රිකෝණික අවි ඇත කිතුල්ගල
අන් සත්වයිවි හීලෑ කෙරුමට යෙදුන
උල් දැති මඩු වලිග බටදොඹ ලෙනින් ගෙන

මිය ලිය දනන් ගෙන ගොස් ඉවතට දමලා
මස් දියවෙන්ට හැර ඇටකටු රැස් කරලා
ඔහු දිවි ගෙවූ තැන වෙත යළි ගෙනැවිල්ලා
වකුටු කර වලක නොගැඹුරු ඇත වළලා

මිය යනු ප්‍රථම හේ භාවිත කළ කී දෑ
බෙල්ලන් බැඳි පැලැස්සෙන් හමුවේ වළඳා
ගුරු ගල් ලේපකර එහි හිල් විද නිබඳා
මළවුන් පිදූවයි ලලාට ඇට පළඳා

**ලෝකේශ්වරී සඳමාලි කරුණාරත්න**
සහාය කථිකාචාරිණී
සිංහල අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

## තලතුනා සංක්‍රමණිකයාගේ සංතාපය

බැලු බැලු අත ඇස දකින්නේ ගම් ගස්ය
පැන පැන දුවන්නේ කැන්ගරුවන් රැස්ය
ඉඳහිට පෙනෙන කඳු ගැට පෙල නොම උස්ය
විසුවත් වසර ගණනක් මෙහි හද හිස්ය

ඇති මුත් සියළු සැප සම්පත් අඩු නැතුව
ගෙවුනත් කල දවස නිදුකින් සුව යුතුව
තිබුනත් මිල මුදල ගේ දොර අප සතුව
තවමත් හිතේ ඇත තනිකම ඉස් මතුව

දෙවට දිගේ වතුසුදු මල් පිපෙනව ද
බෝ මළුවට උඩින් පුන්සඳ එබෙනව ද
මල් ආසනේ අරලිය මල් පර වේ ද
සීතල දොලේ නිල් දිය තව බොර නැති ද

බෑණා ලේලි සුදු හම ඇති අය වේ ද
මහළු විය මහළු මඩමේ ගත වේ ද
නෑ හිතවතකු ළඟ පාතක නැති වේ ද
ඇට කටු ටිකත් මෙහිම පොළොවේ සැඟවේ ද

**මොරගොඩ මලියසේන**



## සැනසීම

සැනසුමක සුව සොයා එක දිනෙක
යනු පිණිස බෝ දුරක් එක මගක
අතින් අත බැඳන් ආ මේ ගමන
නැවතුමක් සිතන්නට නම් නොහැක

විඳින්නට මල් සුවඳ පැතිරෙණා
දකින්නට තුරු අරණ සුව දෙනා
අසන්නට තියු ගීත මනසිනා
රැඳෙන්නට නොසිතේද නිතියෙනා

විශ්ව



## යුද්ධයේ සාමය

බංකර් වල හැංගෙන
කුරුළු පැටවුනි
මේ නුඹ විඳින්නේ
සාමයේ
නිවැරදි පාඩම නොවේ
නොහොඳ වැඩිහිටියන්ගේ
වියරු පාඩමයි

බංකර් වල හැංගෙන
කුරුළු පැටවුන් ගැන
නොදන්නා
රූපවාහිනී පාමුල
යුධ
ටැංකි
දැක
දැක
අත්
පොඩි
තලන
කුරුළු පැටවුනි
මේ නුඹ දකින්නේ
සාමයේ
නිවැරදි පාඩම නොවේ
නොහොඳ වැඩිහිටියන්ගේ
නපුරු පාඩමයි..

**මහේෂ් මුණසිංහ**

## මගේ සිත.....!

උදේට
වෙරළමා අම්දින
හවසට
ආයෙමත් හැඩි වෙන
සුදු වැලි මිදුල..........!

**වර්ණ රසිකා**

## දික්කසාදය

රන් හුයෙන් දෑගිලි බැඳී
පෝරු මස්තකයේ රැඳී
සිත නොමැති කය වැළඳ ගත් අපෙ
යුග දිවිය අද සිහිනෙකී

ඔබ ඔබේ ලොව තනි වෙලා
මම ඔබේ ළඟ සැතපිලා
අතීතේ නටඹුන් සෙනේහෙක
මතක සුවඳක් සොයනවා

ඔබෙ සිනා වත ගෙන පියා
කොහේදෝ ඈතක තියා
ඔබේ සතුට ද මගේ සතුට ද
හොයන්නේ හිස බිම තියා

ඔබට මගෙ හිත හිමි නැතී
මට ද ඔබගෙන් එල නැතී
එසේ නම් තව කුමට සොයනු ද
යුග දිවියකට හුරු ගතී

කොලේකට අත්සන් තියා
හිසේ ඇති බර බිම තියා
සතුටු සිතකින් නික්ම යමු අපි
පුරුදු මතකය සොය සොයා

**මංගලිකා පෙරේරා**
ඩමාම් - සවුදි අරාබිය

## පහනක එළිය

අඳුරු කුටියකට වැද
තනිව මා හිඳින කල
දකිමි මුළු ලෝකයම
බීතියෙන් මොර ගසන.

ඉරි තැලුන සිත්තමින්
මුවාකල අඳුරේ
හඬා වැටෙනා ලොවම
නිදන්වේ මසිත තුල.

මිතුර.. නුඹ දල්වන්න
පහන් තිර
අඳුර දුරලා දිනෙක
නුඹේ සිත් කුටිය තුල ..

ඒ එළිය දැක මසිත
ලබනු ඇත
නුවන් දහසක් දිලෙන.

පහන් දැල්ලේ පෙනෙන
ලෝකයේ නැත කඳුල..
දනිමි මා ඒ තුලින්
නුඹද මා දකින බව.

**චන්ද්‍රිකා ද සිල්වා**